




# සම්මාන උළෙල කේන්ද්‍ර කොටගත් සංවාදයට වඩා සාහිත්‍ය කෘති කේන්ද්‍ර කොටගත් සංවාදය වැදගත්

සාහිත්‍ය පිළිබඳව කෙරුණු සංවාද, විසංවාද මැද තවත් සාහිත්‍ය මාසයක් නිමාවට පත්විය. ලංකාවේ සාහිත්‍ය සංවාදයන්හි කේන්ද්‍රීය සාධකය වන්නේ සාහිත්‍ය සම්මාන පිළිබඳ කෙරෙන වාද විවාද බව පුවත්පත් පිටු හා විවිධ වෙබ් අඩවි විමසීමේදී පෙනී යයි. සම්මාන ලබාදීමේ ක්‍රමවේදය ප්‍රශ්න කෙරෙන එවන් සංවාද හැරුණු විට වසරේ ප්‍රශස්ත කෘති පිළිබඳව කෙරෙන ශාස්ත්‍රීය කතිකාවක් දැක ගැනීම උගහටය. පුළුල් සාහිත්‍ය විචාර මණ්ඩපයක් සමාජය තුළ නිර්මාණය වී නැති වටපිටාවක සම්මාන මණ්ඩලයන්හි සම්මාන තීරණය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ කෙරෙන ප්‍රශ්න කිරීම් හුදෙක් පුද්ගල මූලික මත ඉක්මවා නොයයි. අදාල වසරේ පළවන ප්‍රශස්ථ සහිත්‍ය කෘති පිළිබඳ වසර පුරාම සුපුරුදු නිදවේ පසුවන විචාරකයින් හා මාධ්‍යකරුවන් සම්මාන උළෙල කේන්ද්‍රකොට කෙරෙන සංවාදයේ ප්‍රථිපලයක් ඇතැයි මම නොසිතමි. විය යුත්තේ පළමුව අදාල වසර තුළ පලවන කෘති පිළිබඳ අඛණ්ඩ කතිකාවක් වසර පුරාම සමාජය තුළ නිර්මාණය කිරීමයි. සාහිත්‍යයේ ප්‍රගමනයට ඉවහල් වන්නේ එම සංවාදයයි. එය අනෙක් පසින් සම්මාන පිළිබඳ නිවැරදි තීරණ වෙත යන්නට ඇගයුම් මණ්ඩල වෙත නියත තෙරපුමක්ද ඇතිකරනු ලබයි.

ඇතැම් විට පාඨකයන්ට එම වසරේ නිකුත් වූ සාහිත්‍ය කෘති පිළිබඳ දැනුවත් භාවයක් ලැබෙනුයේ සාහිත්‍ය මාසයේ පමණි. සාහිත්‍ය මාසය තුළ කෘතිමව ඇති කරන එම දනුවත් භාවය එම මාසයෙන් පසු යළි දිගු නිද්‍රාවකට පත් වේ. සාහිත්‍ය මාසය වුවද හුදෙක් වැඩිපුර පොත් ටිකක් විකුණා ගැනීමට පොත් ප්‍රකාශකයන් දරන උත්සහයෙන් එහා ගිය ක්‍රියාවලියක් නොවේ.

කෙසේ වුවද සාහිත්‍ය කෘති සඳහා සම්මාන පිරිනමන සම්මාන උළෙල ප්‍රමාණය පෙරට වඩා ඉහළ ගොස් තිබේ. රාජ්‍ය සාහිත්‍ය උළෙල, ස්වර්ණ පුස්තක, ගොඩගේ, හා විද්‍යෝදය වැනි සාහිත්‍ය සම්මාන උළෙල ඒ අතර ප්‍රධාන වේ. රට තුළ සාහිත්‍ය කෘති ඇගයීම සඳහා සැකසෙන මෙවන් සම්මාන උළෙල අපගේ සොම්නසට බඳුන් වුවද සම්මාන සඳහා කෘති තෝරා ගැනීමේදී අනුගමනය කෙරන ක්‍රමවේදයෙහි නොයෙකුත් දුබලතා දැකගත හැකිය.

ඉහළ යනු ඇත. එය සම්මාන පිළිබඳ තීරණ ගැනීමේදී ඉහළ තෙරපුමක් ඇති කරනු ඇති බව මගේ හැඟීමයි. එහෙත් වසරේ ප්‍රශස්ථ කෘතියක් පිළිබඳව කෙරෙන විචාරයක් පුවත්පතක හෝ වෙබ් අඩවියක දැක ගැනීම අතිශය විරල වෙයි. තම හිතවත් ලේකකයකු වෙනුවෙන් තවත් ලේකකයකු ලියනු ලබන සටහනක් හැරුණු විට සම්මාන උළෙල විවේචනයට ඉදිරිපත් වන පිරිසි සාහිත්‍ය කෘතීන්හි දිග පලල විමසුමට ඉදිරිපත් නොවේ. සාහිත්‍ය කරුවාට සිදුව ඇත්තේ තම කෘතිය පිළිබඳ සවයං විචාරයක් සකසා ගැනීමටයි. එසේ නැතහොත් සම්මාන උළෙල පිළිබඳව පලවන

එය මගහරවා ගනු වස් මා ඉහත සඳහන් කළ අඛණ්ඩ සාහිත්‍ය සංවාදයේ දුබලතාවයද බලපා තිබේ. සාහිත්‍ය පිළිබඳව වසර පුරා නිසි සංවාදයක් ගොඩ නැගෙන්නේ නම් සම්මාන මාසයට එළැඹෙන විට ප්‍රශස්ත කෘති පිළිබඳව විචාරකයන්ගේත් පාඨකයන්ගේත් දැනුවත් භාවය අදහස් දෙස බලා සිටීම පමණි. ඉන් සාහිත්‍යකරුවාට ඇති වැඩක් නැත. පළමුව සාහිත්‍ය කෘති පිළිබඳ උසස් සංවාද මණ්ඩපයක් නිර්මාණය විය යුතු යයි මා සඳහන් කළේ එබැවිනි.

රවී සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com



# පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධය

සුපුන් පෙරේරා

දකුණු ආසියානු වෛද්‍ය සහ තාක්ෂණික ආයතනය නමින් පවත්වාගෙන යනු ලබන මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට වෛද්‍යවේදී සහ ශෛල්‍ය වෛද්‍යවේදී උපාධිය (MBBS) පිරිනැමීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යංශය අවසර ලබාදී ඇත. 2011*08*30 දින අංක 1721/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී. දිසානායක මහතා මෙම අවසර ලබාදීම සිදු කර තිබේ. එහෙත් මේ සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය වැනි සංවිධාන විරෝධතාවය පල කොට තිබේ. මෙය ලංකාව වැනි පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා නොමිලේ ඉගෙනුමද ඉන්පසු රජය විසින් රැකියාවක් ද ලබා දිය යුතුයි යන මානසිකත්වයේ ගැලී සිටින සමාජයක ස්වභාවික ප්‍රතිචාරයකි. එම නිසා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීම යනු බොහෝ විරෝධතාවන්ට මුහුණ දිය යුතු තත්වයකි.

1981 දී රාගම දී ඇරඹූ උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සිසු සටන් ඇරඹීම සඳහා හේතු කාරක වූ අතර මෙම ලියුම්කරු ද එවකට විශ්ව විද්‍යාල මගින් මෙහෙයවන ලද සිසු විරෝධතා වලට සහභාගී වී තිබේ. ඉන් දශක 3 පමණ පසු යලි ඇරඹෙන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල කතිකාව කෙරෙහි වඩාත් විචක්ෂණශීලිව බැලීමට මේ දශක තුන අතර කාලයේ සිදු වූ සමාජ වෙනස්වීම්, දේශපාලන අවස්ථාවාදයන්, නොයෙකුත් පාවාදීම් හේතු වී තිබෙන බව පෙන්වා දිය යුතු වේ. 1981 දී ආවේගශීලිව ශිෂ්‍ය (ගිර ) දේශපාලනයක් කල අප දැන් එදාට වඩා අත්දැකීම් ලබා තිබේ. එම නිසා මෙම ගැටලුව දකින්නේ 1981 ළිං මැඩි මානසිකත්වයෙන් නොවේ.

පසුගියදා මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ගැන අදහස් දැක්වූ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මධ්‍යම කාරක සභාව අදාළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයෙන් බිහිවන වෛද්‍ය උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ කිසිවකුට වගකිව නොහැකි බවද ඉන් ලෙඩුන්ට සිදුවිය හැකි අයහපත ගැන මුසප්පුව කතා කළේය. මෙය සත්‍ය වශයෙන්ම අපට විස්මය දනවන්නකි. හෙදියක් ඇග හැපුනත් ලෙඩුන් වලපල්ලට ගිය ද ඉන් කමක් නැතැයි කියා වර්ජනය කල හැකි වෛද්‍යවරුන් සිටින රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට හිටි හැටියේම ලෙඩුන් පිළිබඳව මහා කරුණාවක් පහලවී තිබේ. (වෘත්තිය සමිති ගැන නොසිතා නියමිත ලෙස රාජකාරි කරන වෛද්‍යවරුන් ද සිටින බව අප දනිමු.) නමුත් වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මෙම විරෝධතාවය ලෙඩුන් ගැන මෙත් සිතෙන් ඇති වුවක් බව සිතීමට අසීරු ඔවුන්ගේ අතීත ක්‍රියාකලාපය ජනතාව හොඳින් දන්නා නිසාය. එසේම වර්තමානයේ දී රජයේ රෝහල් වල රෝගීන්ට ගුණාත්මක සේවාවක් ලැබෙන්නේ ද යන්න පිළිබඳව අපට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් පෙරළා ඇසිය හැකිය. මේ විරෝධතාවය අනාගතයේ ඔවුන්ගේ වෙළඳපොල ගැන සිතා මතු වූ එකක් මිස පොදුවේ රෝගීන්ගේ හිත සුව පිණිස හෝ රෝගීන්ගේ සෞඛ්‍ය ගැන සිතා ගත් තීරණයක් නොවේ. එය ආත්මාර්ථකාමය මුල් කොට ගත් ප්‍රතික්‍රියාවකි.

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල රටකට අගුණද? මෙය මතුපිටින් නොව ගැඹුරින් බුද්ධිමත්ව සලකා බැලිය යුතු ප්‍රශ්නයකි. පෞද්ගලික වෛද්‍ය විද්‍යාල බොහෝ රටවල තිබේ. එම රටවල පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීම මගින් රාජ්‍ය වෛද්‍ය විද්‍යාල වලට තරගයක් ඇති කොට ඇති අතර මෙම කණ්ඩායම් දෙක වඩාත් ගුණාත්මක සේවයක් රෝගීන් උදෙසා ලබා දීමට උත්සුක වෙති. එසේම බටහිර රටවල වෛද්‍ය කෂේත්‍රයේ නව සොයාගැනීම් සහ සංවර්ධනයන් බොහොමයක් කොට ඇත්තේ රාජ්‍ය වෛද්‍ය විද්‍යාල නොව පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයි. මේ නිසා මෙම කරුණ පිළිබඳව අප වඩාත් පළල්ව සිතිය යුතුය. ඉන්දියාව, නේපාලය වැනි අපගේ යාබද රටවල් පවා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කොට විදේශ සිසුන් ගෙන්වාගෙන රටට ආදායමක් ලබා දෙති. නමුත් අපගේ රටේ විදේශ අධ්‍යාපනය සඳහා සිසුන් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වියදම් කොට පිටරට යති. මෙම තත්වය ගැන අප වඩාත් දුරදිග සිතිය යුතුය.

පෞද්ගලිකරණය සෑම ගැටළුවකටම පිළියමක් නොවේ. පෞද්ගලිකරණය සමහර විට ලංකාව වැනි රට වල වෙනත් ගැටළු මතු කොට තිබේ. උදාහරණයක් ලෙස ගරා වැටී තිබූ ලංගමට අතිරේකව පෞද්ගලික ප්‍රවාහන ක්‍රමයක් ඇති කිරීම

***<u>ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව කොළඹ විශ්ව විද්‍යාලයට ලැබී තිබෙන්නේ 2690 ස්ථානයයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය 2615 ද රුහුණ විශ්ව විද්‍යාලය 2552 ස්ථානයටද පත්ව තිබේ.</u>***

මගින් මගී ප්‍රවාහනය වඩාත් ප්‍රවර්ධනය වූ නමුදු පෞද්ගලික ප්‍රවාහන සේවය නිසි පාලනයකින් හා විනයකින් බැහැර වීම නිය අයාලේ යන සේවාවක් බවට පත් විය. එම නිසා වෙනත් රටවල් ඉතා සාර්ථකව ගුණාත්මක සෞඛ්‍ය සේවයක් සමග ලාභ ලබන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කොට ඉන් එල නෙලා ගත්තද අපගේ කළමනාකරණ හැකියාවන් වල ඇති දුබලතා හා දේශපාලන ඇඟිලි ගැසීම් නිසා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අයාලේ යන අධ්‍යාපන කඩ වීමේ ඇති සම්භාවිතාවද අප මෙහිදී සිතා බැලිය යුතුය. එම නිසා දේශීය විශ්ව විද්‍යාල මෙන් ඉබාගාතේ යන අධ්‍යාපන ක්‍රමයක් එහිද ඇති වුවහොත් පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීම මගින් අනෙකුත් රටවල් ලබා ඇති ප්‍රතිලාභ ලංකාවට ලබා ගැනීමට අසීරු වනු ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වල ගුණාත්මකභාවය භාවය අතින් විශාල පිරිහීමකට ලක්වී තිබේ. 2011 ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව කොළඹ විශ්ව විද්‍යාලයට ලැබී තිබෙන්නේ 2690 ස්ථානයයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය 2615 ද රුහුණ විශ්ව විද්‍යාලය 2552 ස්ථානයටද පත්ව තිබේ. අපගේ විශ්ව විද්‍යාල අර්බුද සහිත අසාර්ථක රාජ්‍යයක් බවට පත් වී තිබෙන අප්‍රිකාවේ සිම්බාබ්වේ රාජ්‍යයේ විශ්ව විද්‍යාල වලටත් වඩා පහලින් සිටින බව නොරහසකි. ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව සිම්බාබ්වේ විශ්ව විද්‍යාලය සිටින්නේ කොළඹ විශ්ව විද්‍යාලයටත් වඩා ඉහල 2246 ස්ථානයේ ය. එම නිසා ලංකාවේ රාජ්‍ය වෛද්‍ය විද්‍යාල වලින් ගුණාත්මක හා දක්ෂ පිරිසක් බිහි වන බව කීම විහිළුවකි. යටත් පිරිසෙන් නේපාලයේ මනිපාල් විශ්ව විද්‍යාලයට අද අන්තර්ජාතික වශයෙන් තිබෙන පිළිගැනීම අපගේ කිසිදු වෛද්‍ය විද්‍යාලයකට නොමැත. එම නිසා යම් ලෙසකින් මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ගැටලුවකින් තොරව ස්ථාපිත වුවහොත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විශේෂ වැඩ කොටසක් පැවරී තිබේ.

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිළිබඳව කතිකාව ගැන කරුණු සොයන විට මට 1981 දී රාගම දී ඇරඹූ උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුධව සටන් කල එවකට වෛද්‍ය සිසුවෙකු වූ දැනට පෞද්ගලික රෝහලක අධිපතිත්වය දරන දොස්තර මහතෙකු හමු විය. ඔහුගේ රූපාන්තරණය ගැන යම් යම් ගැටළු මට ඇතත් ඔහුගේ අවංකව කරුණු පිළිගැනීමේ ගුණාංගය මගේ ප්‍රසාදයට හේතු විය. ඔහු මට උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳව මෙතෙක් බොහෝ දෙන නොදැන සිටි කරුණු අනාවරණය කළේය. ඔහු පෙන්වා දෙන පරිදි උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය විසින් බිහි කල සුළුතරයක් වූ වෛද්‍යවරු අද ඉතාම ගුණාත්මක සේවයක නිරතව සිටිති. ඔවුන් බොහෝ දෙනෙකු අද විශේෂඥ වෛද්‍යවරුන්ය. සමහරෙකු පිටරට රෝහල් වල විදේශීය විශ්ව විද්‍යාල වල උසස් තනතුරු දරති. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ පිළිබඳ දන්නා නමුදු ඒ ගැන මුනිවත

41 වන පිටට